## 6 පුරස්ථ ග්‍රන්ථියේ පිළිකාව

### රෝග ලක්ෂණ

- අවශ්‍යතාවය ඇතත් මුත්‍රා පහ කිරීමේ අපහසුතාව
- මුත්‍රා කිරීම ඇරඹීමේ හා මුත්‍රා ධාරාව පවත්වා ගැනීමේ අපහසුතා
- මුත්‍රා කිරීමෙන් පසුද සම්පූර්ණයෙන්ම මුත්‍රා පිට නොවුණා යැයි දැනීම
- නිතර නිතර මුත්‍රා යෑම
- රාත්‍රියට මුත්‍රා කිරීමේ වාර ගණන වැඩි වීම
- මුත්‍රා සමඟ ලේ පිටවීමක්




## 7 තයිරොයිඩ් ග්‍රන්ථියේ පිළිකාව

### රෝග ලක්ෂණ

- තයිරොයිඩ් ග්‍රන්ථියේ විශාල වීමක් හෝ වෙනසක්
- ගෙලෙහි වසාගැටිති ඉදිමීමක්
- හේතුවක් රහිත කටහඬේ ගොරෝසු බවක්
- හුස්ම ගැනීමේ අපහසුවක්
- ගෙලෙහි වේදනාවක්
- ගිලීමේ අපහසුවක්



## පහත රෝග ලක්ෂණ සති තුනකට වඩා පවතී ද?

- කල් අල්ලා පවතින කැස්ස හෝ කැස්ස සමඟ ලේ යෑම
- කටහඬෙහි වෙනසක්
- ගැටයක, ලපයක හෝ ඉන්නෙකුගේ හදිසි වෙනස් වීමක් හෝ සීඝ්‍ර වර්ධනයක්
- පියයුරු වල හෝ අන් තැනක ගැටයක්/ඝන වීමක්
- කාන්තාවක් නම් යෝනි මාර්ගයෙන් අසාමාන්‍ය ශ්‍රාවයක් හෝ රුධිරය පිටවීමක්
- මළ හෝ මුත්‍රා පහ කිරීමේ පුරුදුවල වෙනසක් හෝ එමගින් ලේ ගැලීමක්
- කල් අල්ලා පවතින අජීරණ තත්ත්වයක් හෝ ගිලීමේ අපහසුවක්
- මුඛයේ සුදු හෝ රතු ලප හෝ ප්‍රදේශ මතුවීමක්
- ගෙල/තයිරොයිඩ් ඉදිමුමක්
- සුව නොවන තුවාලයක්

**එසේනම් ඒවා පිළිකාවක ලක්ෂණ වීමට ද ඉඩ ඇත**
**වහාම වෛද්‍යවරයෙකු හමුවන්න**

**පිළිකා කලින් හඳුනා ගනිමු**
**නිරෝගී ජීවිතයක් ගත කරමු**

ජාතික පිළිකා මර්දන වැඩ සටහන
555, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05
ටෙලි : 011-2368627, 0113159227

E : nccpsl@yahoo.com
W : www.health.gov.lk

Produced by : PRINTCARE



# පිළිකා කලින් හඳුනා ගැනීමෙන් ජීවිතය ජයගනිමු

## ඔබ දන්නවාද?

**පිළිකා වලින් 1/3 ක්ම කලින් හඳුනාගෙන සම්පූර්ණයෙන් සුව කළ හැකිය.**

**එය ඔබට නිරෝගී ජීවිතයක් ගත කිරීමට මඟ පාදයි.**

**මේ සඳහා ඔබේ ශරීරයේ දිගටම පවතින යම් වෙනසක් ඇති නම් වහාම වෛද්‍යවරයකු හමුවන්න**

## සැළකිළිමත් වන්න

**පිළිකා කලින් හඳුනා ගැනීම සඳහා පහතදී ඇති රෝග ලක්ෂණ ඇත්නම් විහාම වෛද්‍ය උපදෙස් ලබා ගන්න**

## 1 මුඛ පිළිකාව/ මුඛ පූර්ව පිළිකාව

මුඛ පිළිකාව ඇති වීමට පෙර පූර්ව පිළිකා අවස්ථාවේදීම එය හඳුනාගත හැකිය

### රෝග ලක්ෂණ



❶ කල් පවතින, වේදනාවක් නැති, ඉවත් කළ නොහැකි සුදු හෝ රතු ලප



❷ කල් පවතින, ඉවත් කළ නොහැකි සුදු සහ රතු මිශ්‍ර ලප



❸ මුඛයේ අසාමාන්‍ය දැවිල්ලක් සමඟ තොල් සහ මුඛ ශ්ලේෂමලය රළුවීමක් සහ සුදු වීමක්

❹ මුඛයේ සුව නොවන තුවාලයක්

❺ දිව නැවීමේ සහ මුඛය විවෘත කිරීමේ අපහසුතා

**මෙම ලක්ෂණ ඇත්නම්**
**විහාම දන්ත ශල්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගන්න**

## 2 ගල නාල පිළිකාව

### රෝග ලක්ෂණ

සති තුනකට වඩා පවතින

- ක්‍රම ක්‍රමයෙන් ඇතිවන ගිලීමේ අපහසුතාවක්
- ගිලීමේදී වේදනාවක්
- ශරීරයේ බර අඩු වීමක්



## 3 මහා අන්ත්‍ර හා ගුද මාර්ග පිළිකාව

### රෝග ලක්ෂණ

සති තුනකට වඩා පවතින

- මළපහ සමඟ ලේ පිටවීමක්
- මළපහ කිරීමේ වෙනසක්
- නිතර නිතර ඇතිවන මළ බද්ධය හෝ පාචන ස්වභාවයක් හෝ ගුද මාර්ගයෙන් ලේ පිටවීමක්
- මළපහ කලින්ට වඩා සිහින් ස්වභාවයක්
- මළපහ කිරීමෙන් පසුව ද මළපහ කිරීමේ අසම්පූර්ණ බවක් දැනීම
- උදරයේ වේදනාව
- අනපේක්ෂිත ලෙස ශරීරයේ බර අඩු වීමක්




## 4 පියයුරු පිළිකාව

### රෝග ලක්ෂණ



මෑතකදී ඇතිවූ පියයුරුවල හැඩයේ වෙනස්වීමක් හෝ පැහැදිලි අසමමිතික බවක්



දොඩම් ලෙල්ලක මතුපිට වැනි, සමේ වෙනස්වීමක්



පියයුරේ වල ගැස්මක්



පියයුරුවල ගැටිත්තක් හෝ ඉදිමීමක්

සම මතුපිට දදයක්/තුවාලයක්



තනපුඩුවේ ගිලී යාමක් හෝ වෙනසක්

**ස්වයං පියයුරු පරීක්ෂාවෙන්**
**පියයුරු පිළිකා කලින් හඳුනා ගත හැක**

## 5 ගැබ්ගෙල පිළිකාව

### රෝග ලක්ෂණ

- යෝනි මාර්ගයෙන් අක්‍රමවත් රුධිර වහනයක්
- ලිංගික සංසර්ගයට පසු රුධිර වහනයක්
- යෝනි මාර්ගයෙන් දුර්ගන්ධයකින් යුතු ශ්‍රාවයක් පිටවීම.
- මාස් ශුද්ධිය නැවතී ඇති කාන්තාවන් ගේ යෝනි මාර්ගයෙන් රුධිරය පිටවීම




**පැප් පරීක්ෂාවක් මඟින් ගැබ්ගෙල වෙනස් කම් පිළිකාව**
**ඇතිවීමට පෙර හඳුනා ගත හැක**